# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


2013/11/06

## මාධ්‍ය නිවේදනයයි

### මාලඹේ SAITM ආයතනය නිසා තුන්වන වෛද්‍ය සභා සභාපතිත් ගෙදර යයිද?

වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බිඳ වැටුනොත් අප කාගෙත් සෞඛ්‍ය තර්ජනයට ලක් වන්නේ අසම්පූර්ණ පුහුණුවක් ලැබූ වෛද්‍යවරුන්යැයි කියා ගන්නා පිරිසකගෙන් වෛද්‍ය ප්‍රතිකාර ගැනිමට සිදුවන හෙයිනි. එබැවින් සෑම රටකම වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැක ගැනිම රජය වෙත පැවරෙන මූලික වගකීමකි. මෙතෙක් ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය සේවාවේ ප්‍රමිතිය අන්තර්ජාතික මට්ටමින් පැවතුනි. මේ හේතුවෙන් රටේ බොහෝ ක්ෂේත්‍ර බිඳ වැටෙද්දි දේශිය සෞඛ්‍ය සේවා ජාත්‍යන්තර දර්ශක හා සැසදෙමින් ප්‍රශංසනීය සේවාවක් ඉටු කල බව ඔබ සැම දන්නා කරුණකි.

එය රට පුරා සමානාත්මතාවයෙන් යුතුව බෙදා හැරීම නිසා රටේ දුප්පත් පොහොසත් සැමට සමාන ප්‍රතිකාර ලැබුණි. කොළඹට පමණක් නොව යුද්ධය පැවති අවධියේදි පවා යුද්ධයෙන් පිඩිත ප්‍රදේශවලට පවා ප්‍රමිතියෙන් ඉහල සේවාවක් රටටම ලබා දිමට හැකි විය.

යුද්ධයෙන් පසු ප්‍රමිතියෙන් තොර වෛද්‍ය විද්‍යාල බිහි කිරිමට යම් දේශපාලඥයින් විවිධ අයුරින් කටයුතු කරන අයුරු දක්නට ඇත. මාලඹේ "පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය" කිසිදු ප්‍රමිතියක් හා අනුමැතියක් නොමැති නිති විරෝධී ආයතනයක් බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය "Report on the ill-Conceived Private Medical College at Malabe" නම් වූ වාර්තාව මගින් ප්‍රකාශ කලේය.

මිට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ පංච පුද්ගල වාර්තාව මගින්ද එම අදහස සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල මතය බවට පත්විය. මිට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහලම පරිපාලන නිලධාරියා වන සෞඛ්‍ය ලේකම්තුමා SAITM ආයතනයේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සඳහා කිසිම අනුමැතියක් ලබා නොදුන් බව සෞඛ්‍ය ඇමතිතුමා පැවසූ බව ලිඛිතව ප්‍රකාශ කරන ලදි.

දේශපාලඥයින් නිසා වෛද්‍ය අධ්‍යාපනය රැකගත යුතු ආයතන ප්‍රමිතියෙන් තොර වෛද්‍ය විද්‍යාල වලට වුවද අනුමැතිය දෙන තත්ත්වයට පත්ව ඇත. වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය බිඳ වැටිමෙන් ඇති වන විපාක වෛද්‍යවරුන්ට පමණක් නොව රෝගිවන ඕනෑම අයෙකුට ජිවිතය බේරා ගැනිම සඳහා දැඩි අවධානමකට පත්වන බව නොරහසකි.

මාලඹේ SAITM ආයතනය නිසා වෛද්‍ය සභාවේ හිටපු සභාපති මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මියට ඉල්ලා අස්විමට සිදු වූ අතර වෛද්‍ය සභාවේ හිටපු ලේඛකාධිකාරී විශේෂඥ වෛද්‍ය එන්. ජේ නෝනිස් මහතාට මෙතෙක් හඳුනා නොගත් මැරයන්ගෙන් පහර කෑමට සිදුවිය. වෛද්‍ය සභාවේ වත්මන් සභාපති මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතාද, මාලඹේ SAITM ආයතනයට පිලිගත් පටිපාටියට බැහැරව නිතිමය පිලි ගැනිම ලබා ගැනිමට කටයුතු නොකිරිම නිසා සහ පිලිගත් සභාවලදි මාලඹේ SAITM ආයතනය වෙනුවෙන් ඉදිරිපත් නොවිම ගැන ද දේශපාලකයන්ගේ උදහසට ලක්ව ඇත. මේ බව දැනුම් දි ඇත්තේ මහාචාර්ය කාලෝ ෆොන්සේකාගේ නිවසටම ගිය පුද්ගලයෙකි.

ප්‍රමිතියෙන් තොර මාලඹේ SAITM ආයතනය නිසා වෛද්‍ය සභාවේ තුන් වන සභාපතිවරයාත් ගෙදර යාමට දේශපාලන බලපෑම් එල්ල වෙමින් පවතින බව මෙයින් සනාථ වේ..

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516